**ශීර්ෂය 227- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **227** - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 අගෝස්තු 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ දී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.66,090 ක සංග්‍රහ වියදම් වැය විෂයය අංක 227-01-01-1203 ආහාරපාන හා නිල ඇඳුම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තු පුහුණු අවශ්‍යතාවයන් මත එම වර්ෂයට අදාළ පුහුණු සැලැස්ම සකස් කරන ලද අතර, ඒ සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රු.1,500,000 ක් වූ නමුත් එම වසරේ කාර්ය මණ්ඩල පුහුණු සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල රු. 1,000,000 ක් පමණක් වූයෙන් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ලබාදිය යුතු අත්‍යාවශ්‍ය පුහුණු වැඩසටහන්වල අවශ්‍යතාවය අනුව අදාළ කාලය තුළ සංවිධානය කරන ලද බවත් එම වියදම් අදාළ ප්‍රතිපාදන සීමාව තුළ කළමනාකරණය කරගැනීම සඳහා ඇතැම් පුහුණු වැඩසටහන්වලට අදාළ සංග්‍රහ වියදම් (ආහාරපාන සඳහා වියදම්) ආහාරපාන හා නිල ඇඳුම් වැය විෂයය යටතේ ගිණුම්ගත කරන ලද බවත් දන්වා තිබුණි. | වියදම් නිවැරදි වැය විෂයය යටතේ ගිණුම්ගත කිරීමට වග බලා ගත යුතු වේ. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාලීය උපකරණ හා පරිගණක උපාංගවල වටිනාකම පිළිවෙලින් රු.3,253,224 ක් හා රු.98,204,083 ක් වුවද 2022 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (ACA 6) හි එය පිළිවෙලින් රු. 3,442,724 ක් හා 98,014,583 ක් ලෙස දක්වා තිබුණි. | පද්ධතියේ දෝශය හේතුවෙන් සිදු වූ වරද මෙම ආරම්භක ශේෂ වෙනස්වීමට බලපා ඇති බව දන්වා තිබුණි. | ශේෂ අසමානතාවට හේතුන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | දෙපාර්තමේන්තුව විසින් ශාඛා කාර්යාල සඳහා නිකුත් කර තිබූ රු.2,736,660 ක් වටිනා UPS 131 ක්, Networking switch with Rack Mount kit 5 ක්, Printers 5 ක් සහ QR Readers 38 ක් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (ACA 6) අපහරණයන් යටතේ දක්වා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිකුත් කිරීමේ නියෝග මගින් වත්කම් නිකුත් කරන අතර ඉන්පසු අදාළ වත්කම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙ හි ඉන්වෙන්ට්‍රියට ඇතුළත්වනු ඇත. 2020/01/22 දිනැති DRP/ST/01/07 අංක දරන ලිපිය පරිදි අදාළ වත්කම් පිළිබඳව ලේඛන තබා ගත යුත්තේ කෙසේද යන්න ප්‍රාදේශීය ලේකම් වෙත දැනුවත් කර ඇත. එබැවින් තවදුරටත් දෙපාර්තමේන්තුවේ ඉන්වෙන්ට්‍රි ලේඛන තුළ එම වත්කම් පවත්වා ගැනීමට අවශ්‍ය නොවන බවත් තවද ඒ වන විට පද්ධතියේ පැවතුණු පහසුකම් පරිදි එම වත්කම් අපහරණ ලෙස ඉවත් කර ඇති බවත් දන්වා තිබුණි. | සත්‍ය වශයෙන් අපහරණය කළ වත්කම් වටිනාකම පමණක් අපහරණ යටතේ දැක්වීමට වගබලා ගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම් අනුමත කරගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානවන විට එලෙස මාරුකර ගනු ලැබූ ප්‍රතිපාදනවලින් සියයට 19 සිට සියයට 79 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | 1201 වැය විෂයය සඳහා මු.රෙ.66 යටතේ මාරුකිරීම් වලින් රු.3,488,317 ක මුදලක් ඉතුරුම් ලෙස පැවතියද, එම මුදලින් රු.2,714,000 ක ප්‍රමාණයක් සඳහා 2022 වර්ෂය තුළදී බැඳීම්වලට එළඹ තිබීම හා 1303 වැය විෂයය යටතේ 2022 වසර සඳහා ඇස්තමේන්තු සැකසීමේදී රු. 913,478 ඇස්තමේන්තු කළ ද මෙම වසර සඳහා ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.200,000 ක් පමණක් වීම සහ 1403 වැය විෂයය සඳහා, රජයේ තීරණයකට විදුලි හා ජල ගාස්තු ඉහළ දැමීම හේතුවෙන්, වියදම් ඇස්තමේන්තු සිදු කරන අවස්ථාවේදී පවතින ගාස්තුවට සාපේක්ෂව ඇස්තමේන්තු කළ ද, පසුව සිදුකළ විදුලි කප්පාදුව හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව ඇති බව දක්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ප්‍රතිපාදන මාරු කර ගැනීමට ක්‍රියාකළ යුතු වේ. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ දී සිදුකළ කාඩ්පත් ප්‍රසම්පාදනය වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.56,492,100 ක් 2022 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණ ද 2023 පෙබරවාරි 28 දින වන විට ද පියවීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික ආයතනයක් මගින් මිලදී ගන්නා ලද පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියනයක් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී එවකට ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් පරිදි ගෙවීම් අත්හිටුවීම හේතුවෙන් 2020 වර්ෂයේදී රු.56,492,100 ක් සඳහා බැරකමක් ඇති විය. ඒ අනුව මේ වන තෙක් උක්ත බැරකම් මුදල ගෙවීම් කිරීම සඳහා අනුමැතියක් ලැබී නොමැති බව දක්වා තිබුණි. | අදාළ කාලපරිච්ඡේදයට අදාළව බැරකම් හා බැදීම් නිරවුල් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ එක් මූලධන වැය විෂයයක ප්‍රතිපාදන ඉතිරිය රු.20,411,831 ක් වුවද මුළු බැරකම් වටිනාකම රු.58,725,713 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම් වටිනාකම රු.38,313,882 ක් විය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ 2019 වසරේදී මිලදී ගන්නා ලද මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියනයක් සඳහා ගෙවීම් කිරීමේදී එවකට ආරක්ෂක ලේකම් විසින් ගෙවීම් කිරීම අත්හිටුවන ලදි. ඒ අනුව මුළු මුදලින් රු. 56,492,100 ක මුදලක් ගෙවීම් කර නොමැත. ගෙවීම් කිරීම් සඳහා අනුමැතියක් 2020 වසරේ සිට මේ දක්වා ලැබී නොමැති අතර මේ වන විට දෙපාර්තමේන්තුව අයත්ව ඇති මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙතින්ද ඉල්ලීම් කරන ලද අතර එම අනුමැතිය 2023 වසරේදී ලැබීමට නියමිත බැවින් 2022 වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කරන ලද බව දන්වා තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතිකර නොගැනීමට වගබලා ගතයුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු.රෙ. 571(1) | 1,195,600 | මුදල් රෙගුලාසි ප්‍රකාරව අර්ධ වාර්ෂික කල් ඉකුත් වූ තැන්පතු ලැයිස්තුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලේඛනයක් සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලේඛණය පිළියෙල කල යුතු වේ. |
| | මු.රෙ. 565(5) | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු 71 ආකෘතියේ වූ පොදු තැන්පතු සාරාංශ පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට පොදු තැන්පතු සාරාංශයක් පොදු 71 ආකෘතිය පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු තැන්පතු සාරාංශ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(ii)** | **2019 ඔක්තෝබර් 23 දිනැති අංක DRP/IT/04/25 දරන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ඡේදය** | - | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීගේ අනුමැතිය ලද හැඳුනුම්පත් අයදුම්පත්‍ර පරිගණක පද්ධතියට ඇතුළත් නොකර මාසයකට අධික කාලයක් හැඳුනුම්පත් අංශයේ රඳවාගත් අවස්ථා පැවතුණි. | එවකට රටෙහි පැවති වාතාවරණය අනුව කොවිඩ් 19 ව්‍යාප්තිය පාලනය කිරීම, ඉන්ධන අර්බුදය, නිලධාරීන් සතියට දින 03 බැගින් සේවයට කැඳවීම, සංවර්ධන නිලධාරීන් සේවා මුර ක්‍රමයට සේවයට කැඳවීම, දිවා කාලයේ පැය 4 ක 5 ක විදුලි කප්පාදුවක් පැවතීම වැනි හේතූන් මත ග්‍රාම නිලධාරීන් වෙතින් ලැබෙන ඉල්ලුම්පත්‍ර එම අවස්ථාවේදීම දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයක් පැවති බව ප්‍රාදේශීය ලේකම්වරු විසින් දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව ක්‍රියාකළ යුතුවේ. |
| **(iii)** | **2016 පෙබරවාරි 23 දිනැති අංක DRP/OP/01/ New.App./43 දරන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛයේ 11 ඡේදය** | - | චක්‍රලේඛ ප්‍රකාරව සහතික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත්කර ඇති අයදුම්පතක් දින 07 ක් ඇතුළත හැඳුනුම්පත් අංශයට භාර දිය යුතු වුව ද, අයදුම්පත්‍ර හැඳුනුම්පත් අංශයට ලැබීමට දින 10 සිට දින 35 ක කාලයක් ගත වී තිබුණු අවස්ථා මෙන්ම ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් භාරදීමට දින 13 සිට දින 51 දක්වා ප්‍රමාද කාලයක් ගත වී තිබුණු අවස්ථා පැවතුණි. | ග්‍රාම නිලධාරීන් විසින් භාරගන්නා අයදුම්පත් සහ ඒ සඳහා අයකර ගන්නා මුදල් සතියකට අඩු කාලයක් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දෙන ලෙස, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් මගින් වරින්වර ග්‍රාම නිලධාරීන් ද, 2022.09.07 දිනැති ලිපිය මගින් ප්‍රාදේශිය ලේකම්වරු තවදුරටත් දැනුවත් කර ඇති බවද දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව ක්‍රියාකළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPIS) තුන අතරින් ප්‍රධාන දර්ශකයන් වන "වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව", ප්‍රතිශතයක් ලෙස සියයට 68 ක් ව පැවතුණි. | පෙර මුද්‍රිත කාඩ්පත් හිඟතාවය හේතුවෙන් මුල්වරට ජාතික හැඳුනුම්පත සකස් කරනු ලැබූ 2005.01.31 දිනෙන් පසු උපත ලද පාසල් ඉල්ලුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත වෙනුවට තොරතුරු තහවුරු කිරීමේ ලිපි තාවකාලිකව නිකුත් කිරීමට කටයුතු කිරීමත් එම ඉල්ලුම්පත් සඳහා හැඳුනුම්පත් මුද්‍රණය නොවූ බැවින් එම ඉල්ලුම්පත් Print Waiting අදියරේ පැවතීමත් හේතුවෙන් 2022 වසර තුළ නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව සාපේක්ෂව අඩු වී ඇති බව දන්වා තිබුණි. | කාර්ය සාධක දර්ශක වෙත ළඟා වීමට වගබලා ගත යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 භාණ්ඩ සමීක්ෂණය තුලින් නිර්දේශ නොකළ රු.881,500 ක් වටිනා පරිගණක 10 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුල (ACA 6) අපහරණයන් යටතේ දක්වා තිබුණි. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් අපහරණය කරන ලද නමුත් අදාළ වර්ෂයේ හි CIGAS පරිගණක වැඩසටහන මගින් එම වත්කම් ඉවත් කර නොතිබුණු බැවින් එය නිවැරදි කිරීම 2022 වර්ෂයේදි සිදු කරන ලද බව දන්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ කරන ලද අපහරණයන් පමණක් මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුල (ACA 6) අපහරණයන් යටතේ දැක්වීමට වගබලා ගත යුතුවේ. |
| (ආ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත 2012 වර්ෂය සිට මේ දක්වා ලබා දුන් වත්කම් අතරින් කොටසක් | e-nic ව්‍යාපෘතිය හෝ වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ අමාත්‍යාංශයක් මගින් හෝ වත්කම් ලැබුණු පසු එම වත්කම් දෙපාර්තමේන්තුවේ වත්කම් වන බැවින් ඒවා CIGAS පරිගණක | ව්‍යාපෘති ප්‍රතිපාදන මඟින් මිලදී ගත් වත්කම් හඳුනාගැනීමට හැකිවන ලෙස ලේඛනගත කිරීමට |

| | | | |
|---|---|---|---|
| | CIGAS වැඩසටහන වෙත ඇතුළත් කර නොමැති අතර, ඇතුළත් කර ඇති වත්කම් අතුරින්ද ව්‍යාපෘතිය මගින් ලබාදුන් වත්කම්ද වෙන්කර හඳුනාගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ පිහිටුවා ඇති ශාඛා කාර්යාල සඳහා ව්‍යාපෘතිය මගින් ලබා දුන් වත්කම් ද බෙදා දී ඇති නමුත් එම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් විධිමත් වූ ලේඛන ද පවත්වාගෙන ගොස් නොතිබුණි. | පද්ධතිය වෙත පද්ධතියේ පවතින පහසුකම් යටතේ ඇතුළත් කර ඇත. CIGAS පද්ධතියේ වත්කම් තොරතුරු ඇතුළත් කිරීමට 2015 සිට පහසුකම් සපයා තිබූ අතර ඉන්පසු කරන ලද මිලදී ගැනීම් හා ලැබීම් CIGAS හි වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇත. CIGAS පද්ධතිය තුළ e-nic ව්‍යාපෘතිය මගින් ලද වත්කම් හඳුනා ගැනීමට ක්‍රමවේදයක් නොමැති අතර ගබඩා අංශයේ පවතින ඉන්වෙන්ට්‍රි ලේඛන තුළින් එම වත්කම් පිළිබඳ තොරතුරු ඇතුළත් විධිමත් ලේඛන ගබඩා අංශයේ පවතින බව දන්වා තිබුණි. | වගබලා ගත යුතුවේ. |
| (ඇ) | ව්‍යාපෘති අංශය විසින් විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය ආරම්භයේ සිට වර්තමානය දක්වා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හරහා ප්‍රාදේශීය කාර්යාල සඳහා වටිනාකම රු. 114,964,961 ක භාණ්ඩ /වත්කම් ලබා දී තිබුණද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව ලබා දී ඇති භාණ්ඩ වටිනාකම රු. 111,616,046 ක් වූ බැවින් රු. 3,348,915 ක භාණ්ඩ ඌණතාවයක් පැවතුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය ආරම්භයේ සිට වර්තමානය දක්වා රු.114,964,961 ක භාණ්ඩ/වත්කම් ලබාදුන් අතර එම භාණ්ඩ/වත්කම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුව තුළ භාවිතයට යොදාගන්නා ලදි. ඒ අනුව රු. 111,616,046 ක භාණ්ඩ/වත්කම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත්, රු 3,348,915 ක භාණ්ඩ/වත්කම් දෙපාර්තමේන්තුව තුළද භාවිතයට යොදාගෙන ඇති බව දන්වා තිබුණි. | ව්‍යාපෘති ප්‍රතිපාදන මගින් ලබාදුන් වත්කම් වෙනම හඳුනාගත හැකි ලෙස ලේඛනගත කළ යුතු වේ. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2022 අගෝස්තු 15 දින සිට ක්‍රියාත්මක තැපැල් ගාස්තු | 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද නව තැපැල් ගාස්තුව සම්බන්ධයෙන් ජාතික හැඳුනුම්පත තැපැල් කිරීමට අදාළව | මුද්දර කවර ප්‍රමාදයකින් තොරව ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට හා ඒවා |

| | | |
|---|---|---|
| සංශෝධනයට අනුරූපීව ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි තැපැලට යොමු කිරීම සඳහා වන ගාස්තුව රු.45 සිට රු.110 දක්වා වැඩි කරමින් 2022 අගෝස්තු 18 දිනැති අංක DRP/OP/01/DS/03 දරන අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර තිබුණි. චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාව වන විට භාවිතයට නොගත් රු.4,298,895 ක් වටිනා මුද්දර ඇල වූ ලිපි කවර 95,531 ක් 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා ලේඛනාගාරය විසින් ප්‍රධාන කාර්යාලයට එවා ඇති අතර ප්‍රමාදයකින් තොරව නියමිත කාලය තුළ ලැබුනේ නම් එම මුද්දර කවර භාවිතා කළ හැකිව තිබුණි. | සහනයක් ලබාදෙන මෙන් ඉල්ලා DRP/OP/01/GEN/24 අංක දරන හා 2022.05.30 දිනැති ලිපිය මගින් තැපැල්පති වෙත ඉල්ලීමක් සිදු කරන ලද අතර, ඒ සඳහා තැපැල්පතිගේ අංක DOP/HQ(OP)LSN02/Price – Riv/20/2022 හා 2022.08.23 දිනැති ලිපිය මගින් 2022.10.31 දින වනතෙක් සහන කාලයක් ලබා දෙන ලදී. ඒ අනුව පැරණි රු.45 මුද්දර කවර උපරිම ප්‍රමාණයන් භාවිතා කිරීමට කටයුතු කරන ලදී.<br><br>එමෙන්ම, ජාතික හැඳුනුම්පත් මුද්‍රණය කිරීම සඳහා පෙර මුද්‍රිත කාඩ්පත් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කිහිපයක්ම දෙපාර්තමේන්තුවට පරිබාහිර වූ කරුණු හේතුවෙන් අවලංගු වූ බැවින් ජාතික හැඳුනුම්පත් මුද්‍රණය සඳහා ප්‍රමාණවත් පෙර මුද්‍රිත කාඩ්පත් තොග පවත්වා ගැනීමට නොහැකි විය. ඒ අනුව, දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලුම්පත් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සීමා කරමින් සිදුකළ බැවින්, දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මුද්දර ඇලවූ සියලුම ලිපි කවර භාවිතා කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | කාර්යක්ෂම ලෙස භාවිතයට පියවරගත යුතු වේ. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණය කරන ලද මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව 628,973 ක් වූ අතර, ඉන් 22,497 ක් හෙවත් සියයට 4 ක් දෝෂ සහිත විය. මෙම දෝෂ සහිත හැඳුනුම්පත් PVC හා Polycarbonate යන කාඩ්පත් වර්ග දෙකෙන්ම අන්තර්ගත වූ නමුත් දෝෂ සහිත මුළු හැඳුනුම්පත් | මුද්‍රණ කාර්යයේදී විවිධ හේතු මත අවලංගු කරන ලද කාඩ්පත් (DU/SPOIL) පිළිබඳ වාර්තා ලබාගැනීම InforID පද්ධතිය මගින් සහ මුද්‍රණ අංශය සතු භෞතික කාඩ් ප්‍රමාණයන් මත පදනම්ව සිදු කරන අතර, භෞතික කාඩ් ප්‍රමාණයන් සම්බන්ධව වාර්තා තබා ගැනීමේදී PC කාඩ් PVC කාඩ් ප්‍රමාණයන් 2022.06.30 දින දක්වා වෙන් වෙන් වශයෙන් ගණනය කර නොමැති බව දන්වා තිබුණු අතර ඉදිරියේ දී DU/SPOIL කාඩ්පත් සඳහා | දෝෂ සහිත හැඳුනුම්පත් කාඩ්පත් වර්ගය අනුව වෙන වෙනම හඳුනාගෙන ලේඛනගත කිරීමට පියවර ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය, උක්ත කාඩ්පත් වර්ග දෙක සඳහා වෙන වෙන ම ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බැවින් දෝෂ සහිත හැඳුනුම්පත්වලට අදාළව පිරිවැය ගණනය සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි. | භෞතික වාර්තා සකස් කිරීමේදී PC කාඩ් සහ PVC කාඩ් ප්‍රමාණයන් වෙන වෙනම සංඛ්‍යා ලේඛනයන් පවත්වාගෙන යා යුතු බවට මුද්‍රණ අංශය දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් ශාඛා කාර්යාල 335 ක් සඳහා වෙන්ව හඳුනාගත් විදුලි බිල්පත් වියදම වූ රු.5,961,205 ක් දෙපාර්තමේන්තු වැය විෂයය අංක 227-01-01-1403 යටතේ ගෙවීම් කිරීමකින් තොරව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති ප්‍රතිපාදන මගින් ගෙවීම් කර තිබුණි. | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය හැඳුනුම්පත් ඒකක නවීකරණය කර ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වගකීම විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය වෙත පැවරී තිබූ අතර, එම කාර්යාල වල අවශ්‍ය පහසුකම් සැපයීමෙන් පසු දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන තෙක් විදුලි බිල්පත් ඇතුළු සියලු නඩත්තු වියදම්ද ව්‍යාපෘති කාර්යාලයෙන් දැරීමට සිදු වූ අතර 2022.12.31 දිනෙන් පසු, එම කාර්යාලවල විදුලි වියදම් ඇතුළු සියළු එදිනෙදා නඩත්තු වියදම් මෙම ව්‍යාපෘතිය මගින් ගෙවීම් නොකරන බව දන්වා තිබුණි | දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන අනුමත කර ගැනීමට වගබලා යුතු වේ. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ නිළධාරීයකුගෙන් අයවිය යුතු ණයශේෂය රු.45,413 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවයෙන් පහ කළ නිළධාරියකුගේ බිරිඳ විසින් රු.35,000 ක මුදලක් 2023.01.09 දින පියවා ඇති බවද ඔහු විසින් තවදුරටත් ගෙවිය යුතු හිඟ මුදල ගෙවන ලෙස ඔහුගේ විදේශ ලිපිනය වෙත ලිඛිතව දන්වා යැවූ බවද දන්වා තිබුණි. | ණයශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය සඳහා වූ ණයගැති හා ණයහිමි ලේඛනයේ නම් සඳහන් නිලධාරීන් 05 කගේ නම් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය තුළ ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ නාම ලේඛනයට ඇතුළත් වී නොතිබුණි. | නිලධාරීන් 05 දෙනෙකුගේ නම් ස්ථාන මාරු වී ගිය නිළධාරීන්ගේ නාම ලේඛණයට ඇතුලත් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ නාම ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1,475 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1,337 ක් වූ බැවින් පුරප්පාඩු 138 ක් පැවතුණි. | වාර්තාවේ සඳහන් 2022 දෙසැම්බර් 31 දිනට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ තොරතුරු නිවැරදි බව දක්වා තිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු වේ. |
| (ආ) | නීති නිලධාරී භාෂා පරිවර්තක (සිංහල-දෙමළ), කාර්මික නිලධාරී ඇතුලු තනතුරු 06 ක් සඳහා අනුමත තනතුරු සංඛ්‍යාවම පුරප්පාඩු වී පැවතුණි. | නීති නිලධාරී සහ ලිපි සහායක (දෙපාර්තමේන්තුගත) තනතුරුවලට බඳවා ගැනීමේ අනුමැතිය ලබා ගැනීම සඳහා "රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුව" වෙත ඉල්ලීම් ලිපියක් යොමුකර ඇති අතර භාෂා පරිවර්තක (සිංහල - දෙමළ) පුරප්පාඩු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මගින් දන්වා ඇති බව ද කාර්මික නිලධාරී (සිවිල්) සහ කාර්මික නිලධාරී (විදුලි හා ඉලෙක්ට්‍රොනික) තනතුරු සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අමතර ප්‍රතිපාදන සලසාදීමේ සීමාවන් හේතුවෙන් ඉහත තනතුරුවලට බඳවාගැනීමේ අවශ්‍යතාවය පසුව සලකා බැලීම සුදුසු බව යෝජනා කර තිබුණු බව දන්වා තිබූ අතර අයවැය චක්‍රලේක 03/2021 අනුව නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින්, ද්වීභාෂා ලිපිකරු මෙම තනතුර සඳහා නව බඳවා ගැනීම් සිදුකර නොමැති බව දක්වා තිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු වේ. |